සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන්
සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (I)

පැ එකයි මිනිත්තු තිහයි

## (01) සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.

**1.** පහත සඳහන් කරුණු හතරක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) ඒකාබද්ධ සේවා

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(iii) නැවත සේවයට බඳවා ගැනීම

(iv) මාරු මණ්ඩල

(v) තනතුරක හෝ නිලධාරියකුගේ තත්ත්වය

**2.** රජයේ පත්කිරීම් කෙරෙහි බලපාන නියමයන් හා කොන්දේසි පැහැදිලි කරන්න.

**3.** පහත සඳහන් අවස්ථා කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීම

(ii) තනතුර අත්හැර යාම

(iii) නිවාඩු දින වැටුප්

(iv) ආණ්ඩුවට සේවා ඉටුකිරීම වෙනුවෙන් ගෙවන ගාස්තු

**4.** (i) මුල් පත්වීමක දී ගෙවන වැටුප පිළිබඳ ආයතන සංග්‍රහයේ විධිවිධාන පැහැදිලි කරන්න.

(ii) වැටුප් පරිමාණයක් ප්‍රතිශෝධනය කිරීමේ දී ගෙවන වැටුප පිළිබඳ විධිවිධාන කවරේ ද?

**5.** (i) අතිකාල වැඩ පාලනය පිළිබඳ ආයතන සංග්‍රහයේ විධිවිධාන කවරේ ද?

(ii) අතිකාල දීමනා ගෙවිය හැකි අවස්ථා පැහැදිලි කරන්න.

**6.** (i) පරිපාලන කාර්ය පරිපාටි සහ විධි පිළිබඳ සාමාන්‍ය කොන්දේසි පැහැදිලි කරන්න.

(ii) රාජකාරී ලිපි සම්බන්ධයෙන් වන නියමයන් කවරේ ද?

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017(I)

## (02) මුදල් රෙගුලාසි

පැ එකයි මිනිත්තු තිහයි

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

1. (i) මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන වොරන්ට් බලපත්‍ර වර්ග **හතරක්** නම් කර ඒවා එකිනෙකෙහි අරමුණු සඳහන් කරන්න.
   (ii) මුදල් රෙගුලාසිවල සඳහන් පරිදි ජනාධිපතිවරයාට ඒකාබද්ධ අරමුදලින් මුදල් නිදහස් කිරීමට බලය දී ඇති අවස්ථා **දෙක** සඳහන් කරන්න.
   (iii) මුදල් රෙගුලාසිවල සඳහන් වන පරිදි අත්තිකාරම් ගිණුම් වර්ග **පහක්** නම් කරන්න.

2. (i) රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීමේදී අත්හරිනු ලබන අයිතම **පහක්** සඳහන් කරන්න.
   (ii) මු.රෙ. 104(4) යටතේ රජයේ දේපළකට අලාභ හානි සිදුවූ විට ඉදිරිපත් කළ යුතු "පූර්ණ වාර්තාවක" ඇතුළත් වියයුතු කරුණු මොනවා ද?

3. (i) අත්තිකාරම් ගිණුම්වලට අදාළ ඇස්තමේන්තු සකස් කිරීමේ දී අදාළ වන්නාවූ සීමා වර්ග **හතර** මොනවාද?
   (ii) නිෂ්පාදන කටයුතු සම්බන්ධයෙන් වූ අත්තිකාරම් ගිණුමක මුදල් වර්ෂය අවසානයේ සකස් කළයුතු ගිණුම් වාර්තා **හතර** නම් කරන්න.
   (iii) මාසිකව වැටුප් ලබන රජයේ ස්ථිර නිලධාරියකුට තම වැටුපෙන් කොටසක්, වැටුප් ගෙවීමට නියමිත දිනට පෙර ලබා ගත හැකි ය. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවල දැක්වෙන නියමයන් මොනවා ද?

4. (i) මු.රෙ. 8 අනුව අයවැය ඇස්තමේන්තුවක ඇතුළත් වැය විස්තරයක සඳහන් අයවැය වර්ගීකරණ ඒකක මොනවා ද?
   (ii) මු.රෙ. 71 අනුව තනතුරු, සේවක සංඛ්‍යා හා වැටුප් පරිමාණ ඇති කිරීමේදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ පූර්ව අධිකාරි බලය ලබා ගත යුතු වන්නේ කුමන කරුණු සම්බන්ධයෙන් ද?
   (iii) අයවැය ඇස්තමේන්තුවල මූලධන ප්‍රතිපාදන යටතේ වෙන් කරනු ලබන වැය විෂයන් **පහක්** සඳහන් කරන්න.

5. (i) රජයේ දෙපාර්තමේන්තුවක ගිණුම් අංශයේ ගෙවීම් කටයුතු සඳහා භාවිත කරන විවිධ වර්ගයේ වවුචර්පත් **හයක්** ඒවා එකිනෙකෙහි පොදු ආකෘති පත්‍ර අංකය ද සහිතව නම් කරන්න.
   (ii) රජයේ නිලධාරියකුගේ වැටුප් හෝ වේතනවලින් අඩු කෙරෙන ව්‍යවස්ථාපිත අඩු කිරීම් **හතරක්** සඳහන් කරන්න.

6. කෙටි සටහන් ලියන්න.
   (i) වීරමොං ක්‍රියාපටිපාටිය
   (ii) පුනරාවර්තන වියදම්
   (iii) අවිනිශ්චිත අවස්ථා අරමුදල (Contingencies Fund)
   (iv) අධිභාර (Surcharges)
   (v) ජීවත්වන බවට දෙනු ලබන සහතිකය

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (I)

## (03) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය

පැ දෙකයි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයෙහි රජයේ ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම හා මූලික යුතුකම් යටතේ ඇති අධ්‍යාපනයට සම්බන්ධ අරමුණු මොනවා ද?

   (ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව පළාත් අධ්‍යාපන මණ්ඩල පිහිටුවීමේ දී අනුගමනය කළ යුතු විධිවිධාන මොනවා ද?

   (iii) 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත අනුව රහස්‍ය ලේඛන ලෙස සලකනු ලබන ලේඛන මොනවා ද?

   (iv) ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක මණ්ඩලයේ සංයුතිය දක්වන්න.

   (v) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ කණිෂ්ඨ ද්විතීයික අවධියේ සිසුන්ට ප්‍රායෝගික හා තාක්ෂණ කුසලතා ලබාදීම සඳහා විෂයමාලාවේ අඩංගු වූ විෂයයන් කවරේ ද?

   (vi) 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව යටතේ පිහිටවනු ලැබූ පර්ෂද පාසල් සංකල්පය සැකෙවින් පැහැදිලි කරන්න.

   (vii) දැනට අ.පො.ස.(සා.පෙළ) ශිෂ්‍යයකු විසින් හැදෑරිය යුතු හර විෂයයන් මොනවා ද?

   (viii) වර්ෂ 2007 දී පාසල්වලට හඳුන්වා දුන් විෂයමාලාව නිපුණතා පාදක විෂයමාලාවක් වශයෙන් හැඳින්වේ. මෙහි 'නිපුණතා' යන්න නිර්වචනය කරන්න.

   (ix) ජාතික ගුරු අධ්‍යාපන පීඨ සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනයෙන් ඉටු විය යුතු කාර්යයන් දෙකක් දක්වන්න.

   (x) අධ්‍යාපන අමාත්‍යාංශයට ලැබෙන විදේශාධාර භාවිතය සඳහා පැවති 'ව්‍යාපෘති ක්‍රමය (project mode)' වෙනුවට ආංශික සංවර්ධන සැලසුම් ක්‍රමය (Education Sector Development Programme) භාවිත කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාකර ඇත. මෙම නව ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ දෙකක් දක්වන්න.

*(ලකුණු 04 × 10 = 40 යි)*

2. (i) 'පාසල් පාදක කළමනාකරණය' යන්න සැකෙවින් පැහැදිලි කරන්න.

   (ii) මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ශ්‍රී ලංකාවේ පාසල්වල පිහිටුවා ඇති ව්‍යුහය කෙටියෙන් දක්වන්න.

   (iii) 'පාසල් පාදක ගුරු සංවර්ධනය' සඳහා විදුහල්පතිවරයකුට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න.

   (iv) 'පාසල් ප්‍රජාවට අයත් වන පාර්ශ්වයන් මොනවා ද?

*(ලකුණු 20 යි)*

3. (i) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ පූර්ව සේවා ගුරු පුහුණුව ලබාදෙන ආයතන නම් කරන්න.

   (ii) ශ්‍රී ලංකාවේ පාසල්වල සේවය කරන ගුරුවරුන්ට සේවාස්ථ පුහුණුව ලබාදීම සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

   (iii) ගුරු උපදේශකවරුන්ගේ සේවය ඵලදායිව ලබා ගැනීම සඳහා ගත හැකි පියවර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

   (iv) ගුරු සේවය වෘත්තීයමය සේවාවක් වශයෙන් පිළිගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

*(ලකුණු 20 යි)*

[ 2 වන පිටුව බලන්න.

103



4. (i) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීමට තුඩුදුන් පසුබිම පැහැදිලි කරන්න.

(ii) එම කොමිෂන් සභාවේ සංයුතිය දක්වන්න.

(iii) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අඩංගු කළ හැකි ක්ෂේත්‍ර පහක් නම් කරන්න.

(iv) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා පනතේ යොදා ඇති විධිවිධාන මොනවා ද?

*(ලකුණු 20 යි)*

5. 1987 දහතුන් වන ආණ්ඩුක්‍රම සංශෝධනය යටතේ පළාත් සභාවලට විමධ්‍යගත කර ඇති බලතල අනුව

(i) පළාත් සභා පාසල්වලට ගුරුවරුන් පත්කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

(ii) පළාත් සභා පාසල්වලට විදුහල්පතිවරුන් පත්කිරීම සඳහා පළාත් සභාවලට ඇති බලතල කවරේ ද?

(iii) පළාත් සභා පාසල්වල සේවය කරන නිලධාරීන්ගේ විනය කටයුතු සම්බන්ධයෙන් පවතින තත්ත්වය පැහැදිලි කරන්න.

(iv) පළාත් සභා පාසල්වල ගුරුවරුන් පුහුණු කිරීම හා විෂය මාලාව සම්බන්ධයෙන් පළාත් සභාවලට ඇති බලතල මොනවා ද?

*(ලකුණු 20 යි)*

***